# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2403/55 - 2024 සැප්තැම්බර් මස 27 වැනි සිකුරාදා - 2024.09.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම්

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(1) උප වගන්තිය යටතේ ඌව පළාත් ආණ්ඩුකාරවර ඒ. ජේ. එම්. මුසම්මිල් වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත සඳහන් පත්කිරීම් සිදු කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියේ නිලධාරී ඉංජි. එම්. ටී. ජී. ඒ. එන්. ලක්මාල් මහතා 2023.02.02 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඌව පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ වශයෙන්.

02. ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය ජේ. සී. එම්. තෙන්නකෝන් මහත්මිය 2023.12.11 වන දින සිට 2023.12.19 වන දින තෙක් විදේශ ගත වන බැවින්, 2023.12.11 වන දින සිට එම මහත්මිය නැවත දිවයිනට පැමිණෙන තෙක්, විශේෂඥ වෛද්‍ය (ප්‍රජා සෞඛ්‍ය) එම්. එම්. එම්. බී. මාරසිංහ මහතා තම නිත්‍ය තනතුරේ රාජකාරීවලට අමතරව ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ආවරණය කිරීමට.

03. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ I ශ්‍රේණියේ නිලධාරී එච්. කේ. පී. ජයලත් මහතා 2023.06.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ වශයෙන්.

04. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරී ඒ. ඩබ්. සේමපාල මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි (2024.01.01) මහියංගන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වශයෙන්.

05. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරී කේ. ජී. සුසිල් විජේතිලක මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි (2024.01.01) වැල්ලවාය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ පූර්ණ කාලීනව වැඩ බැලීමට.

06. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියේ නිලධාරී ඉංජි. ඒ. එම්. ජේ. ටී. ගංගානන්ද මහතා, 2024.02.09 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඌව පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා ) තනතුරේ පූර්ණ කාලීනව වැඩ බැලීමට.

1A - PG 6890 — 07 (2024/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

07. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියේ නිලධාරි ඉංජි. එච්. එම්. ධර්මරත්න මහතා, 2024.02.09 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඌව පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ වශයෙන්.

08. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරිනී එම්. එම්. යූ. එන්. පියසේන මහත්මිය, වහාම ක්‍රියාත්මක වන පරිදි (2024.02.28) තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව පස්සර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට.

09. ශ්‍රී ලංකා වෛද්‍ය සේවයේ නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන I ශ්‍රේණියේ නිලධාරි වෛද්‍ය ඒ. එම්. ටී. කේ. අත්තනායක මහතා 2024.01.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි තම නිත්‍ය තනතුරේ රාජකාරීවලට අමතරව මොණරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට.

10. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරි කේ. ජී. සුසිල් විජේතිලක මහතා, 2024.01.10 වන දින සිට 2024.02.29 වන දින දක්වා තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව, බිබිල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට.

11. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරි එච්. එම්. පී. කේ. හේරත් මහතා, 2024.03.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව, බිබිල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට.

12. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරිනී වී. වී. එම්. ෆොන්සේකා මහත්මිය, වහාම ක්‍රියාත්මකවන පරිදි (2024.03.20) අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වශයෙන්.

13. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරි ඒ. එම්. ආර්. අමරදාස මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි (2024.03.20) ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වශයෙන්.

14. මොණරාගල සහකාර පළාත් පාලන කොමසාරිස් ඩබ්. එම්. පී. පී. කුමාර මහතා නිවාඩු ලබා ඇති බැවින්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරි එස්. පී. අතුකෝරළ මහතා, 2024.03.05 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි 2024.03.18 වැනි දින දක්වා තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව, මොණරාගල සහකාර පළාත් පාලන කොමසාරිස් තනතුරේ රාජකාරි ආවරණය කිරීමට.

15. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරී ඩබ්ලිව්. රන්දෙණිය මහතා, 2024.01.02 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඌව පළාත් මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වශයෙන්.

16. ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය ජේ. සී. එම්. තෙන්නකෝන් මහත්මිය 2024.05.13 වැනි දින සිට 2024.05.17 වැනි දින තෙක් විදේශ ගත වන බැවින්, 2024.05.13 වැනි දින සිට එම මහත්මිය නැවත දිවයිනට පැමිණෙන තෙක්, ඌව පළාත් නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය එල්. පොද්දල්ගොඩ මහතා තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තනතුරේ රාජකාරි ආවරණය කිරීමට.

17. ඌව පළාත් ආයුර්වේද කොමසාරිස් වෛද්‍ය පී. ජී. ඩී. එස්. ප්‍රේමතිලක මහත්මිය 2024.05.14 වැනි දින සිට 2024.05.30 වැනි දින දක්වා විදේශ ගත වන බැවින්, 2024.05.14 වැනි දින සිට එම මහත්මිය නැවත දිවයිනට පැමිණෙන තෙක්, ඌව පළාත් ආයුර්වේද සහකාර කොමසාරිස් වෛද්‍ය එම්. පී. එස්. කරුණාරත්න මහත්මිය තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව ඌව පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුරේ රාජකාරි ආවරණය කිරීමට.

18. මොණරාගල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ එස්. එම්. එස්. උදයංගනී මහත්මිය 2024.05.12 වැනි දින සිට 2024.05.27 වැනි දින දක්වා විදේශ ගත වන බැවින්, 2024.05.12 වැනි දින සිට එම මහත්මිය නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ II ශ්‍රේණියේ නිලධාරිනී එස්. සී. සෙල්ලහේවා මහත්මිය තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව මොණරාගල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුරේ රාජකාරි ආවරණය කිරීමට.

19. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) එම්. එම්. විජේනායක මහතා 2024.07.15 වැනි දින සිට 2024.07.20 වැනි දින දක්වා විදේශ ගත වන බැවින්, 2024.07.15 වැනි දින සිට එම මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි ඩබ්. එම්. ආර්. රංජිත් මහතා තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) තනතුරේ රාජකාරි ආවරණය කිරීමට.

20. ඌව පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුරේ වැඩ බලන ඩී. එම්. කේ. එස්. බී. දිසානායක මහතා 2024.07.26 වැනි දින සිට 2024.08.01 වැනි දින දක්වා විදේශ ගත වන බැවින්, 2024.07.26 වැනි දින සිට එම මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරි එන්. එම්. එස්. පී. කේ. නිශ්ශංක මහතා තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව ඌව පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුරේ රාජකාරි ආවරණය කිරීමට.

21. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ නිලධාරි එස්. ජේ. එම්. ආර්. ආර්. සමරකෝන් මහත්මිය, වහාම ක්‍රියාත්මක වන පරිදි (2024.07.23) ඌව පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යක්ෂ වශයෙන්.

22. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියේ නිලධාරි ඉංජි. පී. එම්. අමරසේකර මහතා, 2024.08.20 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව ඌව පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) තනතුරේ වැඩ බැලීමට.

23. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ II ශ්‍රේණියේ නිලධාරි ජී. ඒ. ආරියසේන ගුරුසිංහ මහතා වහාම ක්‍රියාත්මක වන පරදි (2024.08.27) බිඳුණුවැව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පුහුණු) වශයෙන්.

**ඒ. ජේ. එම්. මුසම්මිල්,**
ඌව පළාත් ආණ්ඩුකාරවර,

2024 අගෝස්තු මස 30 වැනි දින,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

EOG 09 - 0198